


# අසමකාරී ජීවිතය

ඩබ්ලිව්. ඒ. තෙනුලි උදම්යා මෙතුසරී වීරසිංහ

# හයවකාටව් සිහිනය

ඩබ්ලිව්. ඒ. තෙනුලි උදම්යා මෙතුසරි වීරසිංහ
7 ශ්‍රේණිය
මහ/මහමායා බාලිකා විදුහල, මහනුවර

# භයංකාර සිහිනය

**කර්තෘ**
ඩබ්ලිව්.ඒ. තෙනුලි උදමියා මෙතුසරි වීරසිංහ

---

ISBN 978-624-208-828-0

---

**කතෘගේ වෙනත් කෘති**
සෙල්ලම් ගෙදරට ආ අමුත්තා
දඟකාර දුඹුරා

---

**කෘතිය පළ කරන දිනය**
2025. 02. 08

---

**ප්‍රථම මුද්‍රණය**
2025 පෙබරවාරි 08

---

**මුද්‍රණය**
පන්හිඳ ප්‍රින්ටර්ස්, මහනුවර
071 8 822 822

# පිදුම

**මා මෙලොවට බිහි වූ දා සිට**
**ආදරයෙන් රැකබලා ගත්**
**මාගේ ආදරණීය සීයාට හා අත්තම්මලා**
**දෙදෙනාට ඉතා ගෞරවයෙන්**
**යුතුව පුදමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දිනක් මම මගේ යෙහෙළියන් සමඟ පුස්තකාලය වෙත ගමන් කරමින් සිටියෙමි. එක වරම මාගේ අතින් පුස්තකාල පොත ගිලිහුණි. එ තැන විශාල මයිල ගසක් තිබුණි. එම ගසේ අතු විශාල ප්‍රදේශයකට සෙවණ දෙමින් පැතිරී තිබුණු අතර ගහේ ඇතැම් මුල් පොළොවෙන් ඉහළට මතු වී කකුළුවකුගේ අඬු මෙන් විහිදී තිබුණි. එම ගස අසළ ඉතා අඳුරු සහිත වූ අතර බියකරු බවක් ද දැනුණි.



මා සමග සිටි යෙහෙළියන් මයිල ගස අසළින් වේගයෙන් පුස්තකාලය වෙත දිව ගිය අතර මම ගිලිහුණු පොත අතට ගැනීමට උත්සහ කළෙමි. පුදුමයකි. එක වරම මයිල ගහේ විශාල අතු දෙකක් මා වෙත පැමිණ මා අල්ලා ගැනීමට තැත්කළේය. මට ඉමහත් බියක් දැනුණි. මම කෑ ගැසුවෙමි. මම වේගයෙන් පුස්තකාලය වෙත පොතත් රැගෙන දිව ගියෙමි.



මම එම විස්තරය යෙහෙළියන්ට පැවසූ අතර මාගේ කතාවට කිසිවෙක් ඇහුන් කන් නොපිළිගත්හ.

නමුත් මා හට එය පුදුමයකි. පාසල් නිම වී නිවසට පැමිණි මම ඇඟපත සෝදා ගත්තෙමි. රාත්‍රී ආහාර ගෙන අම්මාට මේ බව පැවසුවෙමි. ඇය ගෙන් ද මා හට යහපත් ප්‍රතිචාරයක් නොලැබිණි. පසු දා උදෑසන මම අවදි වුණෙමි. එදා සෙනසුරාදා දිනයකි. උදෑසන ආහාර ගෙන දැල්පන්දු පුහුණු වීම සඳහා මම අප්පච්චි සමග පාසලට ගියෙමු.



ගේට්ටුව අසල සිටි යෙහෙළියන් සමඟ ක්‍රීඩා පිටිය වෙත පිය නැගුවෙමු. ක්‍රීඩා ගුරුතුමිය පැමිණෙන තෙක් අපි අල්ලන් සෙල්ලම් කළේමු. මම සහ මගේ මිතුරිය වන සිතුලි සමඟ පුස්තකාලය වෙත දිව ගියෙමු.

ඉහළට මතු වී තිබූ මයිල ගසේ මූලක හැපී අප දෙදෙනාම බිමට ඇද වැටිණි. අහෝ! විපතකි. එක වරම මයිල ගසේ විශාල අතු දෙකක් අප වෙත වේගයෙන් පැමිණි අපව ගුලි කරගෙන අප ගස මුදුනට රැගෙන ගියේය.



ගසේ සිටි වවුලන් කෑ ගසමින් අහසට ඉගිලි ගිය අතර ගසේ අමු කොළ කිහිපයක් බිමට වැටිණි. අප දෙදෙනාම තවතවත් බියට පත් වුණෙමු. අපි කෑ ගැසුවෙමු. නමුත් කිසිවෙකුටත් ඇසුනේ නැත. ගසින් බැස යාමට ගොඩක් මහන්සි වූවෙමු. සිතුලි කුමන හෝ ආකාරයට ගසින් බැස දිව ගියා ය. මා හට ගසින් බැසගැනීමට නොහැකි වූ අතර ගසේ අතු වලින් මා සඟවා ගෙන සිටියේ ය. මට ගස උඩ මදක් නින්ද ගියේ ය.

සිතුලි මොහොතකින් යෙහෙළියන් සමඟ ගස අසලට පැමිණ මට කතා කළා ය. මම ද ඔවුන්ට කතා කළ නමුත් මාගේ කටහඬ ඔවුන්ට නෑසුනී. ගසේ සිටි වවුලන්ගේ ඝෝෂාව මට මහත් කරදරයක් විය. එක් වරම වවුලන්ගේ මළපහ මාගේ ඇඟ මත පතිත විය. ඒත් සමඟ මට දැනුණ අප්‍රසන්න බව නිසා මා නැවතත් කෑ ගැසීමට උත්සහ කළේ මගේ මුළු ශරීරයම දහඩියෙන් තෙත්ව තිබුණි.

මම තිගැස්සී එක වරම ඇහැරුණෙමි. බැලින් නම් මා දැක තිබෙන්නේ භයන්කාර සිහිනයකි. එවැනි මිනිසුන් බියගන්වන විශාල වෘක්ෂ ලෝකයේ තිබේ ද යන්න මට තවමත් ප්‍රශ්නාර්ථයකි. මා දුටු ඒ භයන්කාර සිහිනය මට අදටත් මායාවකි.

නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-828-0